ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| **නිකුත් කළේ** | ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2020 ජූලි මස 03 දින |

## ශ්‍රී ලංකා මහ බැංකුව විසින් COVID-19 වසංගතයෙන් පීඩාවට පත් ව්‍යාපාර 20,240ක් සඳහා රුපියල් බිලියන 53 ක් අනුමත කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව ශ්‍රී ලංකා රජයේ උපදෙස් සහිතව, COVID-19 වසංගතය හේතුවෙන් පීඩාවට පත් ව්‍යාපාර සඳහා, 4%ක වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය යෝජනා ක්‍රමය, බලපත්‍රලාභී බැංකු හරහා හඳුන්වා දුන් අතර එය රටෙහි ආර්ථික කටයුතු නැවත නගා සිටුවීමට සහය වනු ඇත. වාර්ෂික පිරිවැටුම රුපියල් බිලියනයකට වඩා අඩු ස්වයං රැකියා සහ තනි පුද්ගල ව්‍යාපාර ඇතුළු ඕනෑම ව්‍යාපාරයක් සඳහා මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය සහන ලබා ගත හැක. මෙම රුපියල් බිලියනයක වාර්ෂික පිරිවැටුමේ සීමාව සංචාරක, අපනයන, හා ඒ ආශ්‍රිත සේවාවන් සපයන ව්‍යාපාර සඳහා අදාළ නොවේ.

අදියර 3ක් යටතේ ක්‍රියාත්මක වන මෙම ණය යෝජනා ක්‍රමය හරහා 4%ක වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ කාරක ප්‍රාග්ධන ණය සඳහා රුපියල් බිලියන 150ක මුදලක් මුදා හැරීමට අපේක්ෂිතය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 ජූලි මස 02 දින වන විට ව්‍යාපාර 20,240ක් සඳහා කාරක ප්‍රාග්ධන ණය ලෙස රුපියල් බිලියන 53කට වඩා වැඩි මුදලක් මුදා හැර ඇත. මාස 6ක් දක්වා වූ උපරිම සහන කාල සීමාවක් ද ඇතුළත්ව මාස 24ක් දක්වා වූ ණය ආපසු ගෙවීමේ කාල සීමාවක් සඳහා 4%ක වාර්ෂික සහනදායී පොලී අනුපාතිකයක් යටතේ මෙම ණය ලබා දෙනු ඇත.

2020 අප්‍රේල් මස 01 දින සිට ක්‍රියාත්මක වන මෙම ණය යෝජනා ක්‍රමයේ පළමු අදියර යටතේ, ව්‍යාපාර 13,926ක් සඳහා රුපියල් බිලියන 28ක මුදල් ප්‍රමාණයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලදී. අනුමත කරන ලද ණය අතුරින්, 2020 ජූලි මස 02 වන දින වන විට දිවයින පුරා පීඩාවට පත් ව්‍යාපාර හා තනි පුද්ගල ව්‍යාපාර 10,270ක් සඳහා රුපියල් බිලියන 21කට වඩා වැඩි මුදලක් බලපත්‍රලාභී බැංකු විසින් මුදා හැර ඇත.

2020 ජුනි මස19 දින සිට ක්‍රියාත්මක වන මෙම ණය යෝජනා ක්‍රමයේ දෙවන අදියර යටතේ, ව්‍යාපාර හා තනි පුද්ගල ව්‍යාපාර 6,314ක් සඳහා රුපියල් බිලියන 25ක මුදලක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලදී (වගුව 1 බලන්න).

පළමු හා දෙවන අදියර යටතේ අනුමත කරන ලද සම්පූර්ණ මුදල වන රුපියල් බිලියන 53 අතුරින් 45%ක ප්‍රමාණයක් වෙළඳාම ප්‍රමුඛ සේවා අංශයේ ව්‍යාපාර සඳහාද, 38%ක හා 17%ක ප්‍රමාණයක් පිළිවෙළින් කර්මාන්ත හා කෘෂිකාර්මික අංශයේ ව්‍යාපාර සඳහාද ලබා දී ඇත (වගුව 2 බලන්න).

බලපත්‍රලාභී බැංකුවල පවත්නා අතිරික්ත ද්‍රවශීලීතාව යොදා ගනිමින් ප්‍රමාණවත් සුරැකුම් ඉදිරිපත් කළ නොහැකි ව්‍යාපාර සඳහා අරමුදල් සැපයීමේ අරමුණින්, ශ්‍රී ලංකා මහ බැංකුව 4%ක වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ මෙම ණය යෝජනා ක්‍රමයේ තුන් වන අදියර, ණය ඇප ආවරණ හා පොලී සහන සහිතව 2020 ජූලි මස 01 දින සිට ක්‍රියාත්මක වන බව නිවේදනය කරන ලදි. ඒ අනුව, බැංකුවල පිරිවැය ආවරණය කිරීම සඳහා 5%ක වාර්ෂික පොලී සහනාධාරයක් සැපයීම මගින් අවසාන ණය ගැනුම්කරුවන්ගේ ණය අවදානමෙන් සැලකිය යුතු කොටසක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලබයි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සාපේක්ෂව විශාල ණය වෙනුවෙන් 50%ක සිට කුඩා ණය වෙනුවෙන් 80% ක් දක්වා පරාසයක ණය ඇප ආවරණයක් බැංකුවෙත ලබා දෙනු ඇත.

මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය අයදුම්පත් 2020 අගෝස්තු මස 31 දින දක්වා බැංකු ආයතන වෙත භාර දීම සිදු කළ හැකිය.

## වගුව 1 : "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය යෝජනා ක්‍රමය
## 2020.07.02 දින වන විට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ණය තොරතුරු

| බැංකුව | අදියර I | | අදියර II | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | ණය සංඛ්‍යාව | ණය මුදල (රු.මිලියන) | ණය සංඛ්‍යාව | ණය මුදල (රු.මිලියන) | ණය සංඛ්‍යාව | ණය මුදල (රු.මිලියන) |
| අමානා බැංකුව | 69 | 615 | - | - | 69 | 615 |
| ලංකා බැංකුව | 1,848 | 4,774 | 759 | 2,028 | 2,607 | 6,803 |
| කාගිල්ස් බැංකුව | 11 | 95 | - | - | 11 | 95 |
| සිටි බැංකුව | 4 | 88 | - | - | 4 | 88 |
| කොමර්ෂල් බැංකුව | 731 | 2,799 | 3,215 | 14,345 | 3,946 | 17,145 |
| ඩොයිෂ් බැංකුව | 6 | 140 | - | - | 6 | 140 |
| ඩී.එෆ්.සී.සී. බැංකුව | 442 | 969 | 132 | 336 | 574 | 1,305 |
| හබීබ් බැංකුව | 1 | 25 | - | - | 1 | 25 |
| එච්.ඩී.එෆ්.සී. බැංකුව | 27 | 27 | - | - | 27 | 27 |
| හැටන් නැෂනල් බැංකුව | 731 | 2,502 | 940 | 4,162 | 1,671 | 6,664 |
| එච්.එස්.බී.සී. බැංකුව | 17 | 363 | - | - | 17 | 363 |
| ඉන්දියන් බැංකුව | 14 | 137 | - | - | 14 | 137 |
| ඉන්දියන් ඕවර්සීස් බැංකුව | 2 | 27 | - | - | 2 | 27 |
| මුස්ලිම් කොමර්ෂල් බැංකුව | 14 | 164 | - | - | 14 | 164 |
| නැෂනල් ඩිවලොප්මන්ට් බැංකුව | 467 | 1,398 | 69 | 183 | 536 | 1,580 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 157 | 1,143 | 13 | 84 | 170 | 1,227 |
| පී.ඒ.බී.සී. බැංකුව | 195 | 510 | - | - | 195 | 510 |
| මහජන බැංකුව | 3,687 | 4,896 | 545 | 1,217 | 4,232 | 6,112 |
| පබ්ලික් බැංකුව | 14 | 58 | - | - | 14 | 58 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 3,371 | 1,659 | - | - | 3,371 | 1,659 |
| සම්පත් බැංකුව | 893 | 2,752 | 589 | 2,507 | 1,482 | 5,259 |
| සණස සංවර්ධන බැංකුව | 719 | 692 | - | - | 719 | 692 |
| සෙලාන් බැංකුව | 436 | 1,616 | 50 | 413 | 486 | 2,029 |
| ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව | 5 | 34 | - | - | 5 | 34 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 21 | 89 | - | - | 21 | 89 |
| ස්ටෑන්ඩර්ඩ් චාටර්ඩ් බැංකුව | 4 | 64 | - | - | 4 | 64 |
| ඉන්දියානු රාජ්‍ය බැංකුව (එස්.බී.අයි.) | - | - | - | - | - | - |
| යූනියන් බැංකුව | 40 | 333 | 2 | 28 | 42 | 361 |
| **එකතුව** | **13,926** | **27,969** | **6,314** | **25,303** | **20,240** | **53,272** |

**වගුව 2: "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය යෝජනා ක්‍රමය**
**2020.07.02 දින වන විට අනුමත කරන ලද ණය (අංශ අනුව විශ්ලේෂණය)**

| අංශය | අනුමත කරන ලද ණය | | | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | රු.මිලියන | ප්‍රතිශතය |
| **කෘෂිකර්ම** | **3,244** | **16%** | **8,957** | **17%** |
| වගා කටයුතු | 608 | 3.0% | 947 | 1.8% |
| වැවිලි | 467 | 2.3% | 2,956 | 5.5% |
| කෘෂිකර්මාන්තය ආශ්‍රිත කර්මාන්ත | 1,315 | 6.5% | 3,038 | 5.7% |
| සත්ව පාලනය | 270 | 1.3% | 722 | 1.4% |
| ජල ජීවී වගාව | 451 | 2.2% | 987 | 1.9% |
| වෙනත් | 133 | 0.7% | 307 | 0.6% |
| **කර්මාන්ත** | **6,610** | **33%** | **20,102** | **38%** |
| ඇඟලුම් | 1,872 | 9.2% | 4,724 | 8.9% |
| ඉදිකිරීම් | 2,286 | 11.3% | 6,149 | 11.5% |
| සැහැල්ලු විදුලි යාන්ත්‍රික | 583 | 2.9% | 1,672 | 3.1% |
| රසායන ද්‍රව්‍ය ආශ්‍රිත | 263 | 1.3% | 1,169 | 2.2% |
| සම් හා රබර් | 254 | 1.3% | 706 | 1.3% |
| මුද්‍රණ | 317 | 1.6% | 1,276 | 2.4% |
| වෙනත් | 1,035 | 5.1% | 4,406 | 8.3% |
| **සේවා** | **10,386** | **51%** | **24,213** | **45%** |
| සංචාරක | 1,674 | 8.3% | 4,815 | 9.0% |
| සන්නිවේදන හා තොරතුරු තාක්ෂණය | 910 | 4.5% | 2,389 | 4.5% |
| වෙළඳ | 3,696 | 18.3% | 6,448 | 12.1% |
| සැපයුම් | 602 | 3.0% | 2,147 | 4.0% |
| ප්‍රවාහන | 1,231 | 6.1% | 1,952 | 3.7% |
| සෞඛ්‍ය සේවා සහ ආයුර්වේද | 598 | 3.0% | 1,960 | 3.7% |
| විනෝදාස්වාද | 308 | 1.5% | 659 | 1.2% |
| අධ්‍යාපන | 358 | 1.8% | 802 | 1.5% |
| වෙනත් | 1,009 | 5.0% | 3,041 | 5.7% |
| **එකතුව** | **20,240** | **100%** | **53,272** | **100%** |